# පුස්කොළ පොත්වල කාලය දැක්වීමේ ක්‍රමවේද පිළිබඳ විමසුමක්

- දිවුලපැලැස්සේ විමලානන්ද හිමි

## හැඳින්වීම

පුස්කොළ පොත් රචිත කාලය නිර්ණය කරගැනීමේ දී යොදාගත හැකි ක්‍රමවේද දෙකකි. ඉන් පළමු වැන්න පුස්කොළ පොත් රචකයා විසින්ම තබන ලද දින සටහන් පරීක්ෂා කිරීමයි. ලංකා, බුරුම සහ සියම් පුස්කොළ පොත්වල අවසාන පත්ඉරු මත රචිත කාලය පිළිබඳ විස්තර දැක්වේ. එහෙත් උතුරු තායිලන්තයට අයත් ලන්නා සහ තම් පුස්කොළ පොත්වල රචිත කාලය අවසන් පත්ඉරු මතත් පළමු පත්ඉරුවේ හෝ දැවයෙන් කලාත්මකව නිර්මාණය කළ කම්බා මතත් දක්වා තිබීම විශේෂත්වයකි. කාලය නිර්ණය කිරීමේ දෙවැනි ක්‍රමවේදය නම් අභ්‍යන්තර සාධක ගවේෂණය කිරීමයි. එහි දී අක්ෂර ලීවීමේ ශෛලීන්, සාම්ප්‍රදායික කලාත්මක නිර්මාණ, අතිරේක පාඨ ආදිය පදනම් කරගනිමින් සහ පුරාවිද්‍යාත්මක සාධක මත විද්‍යාත්මක කාලනිර්ණය ක්‍රමවේද අනුගමනය කරමින් රචිත කාලය පිළිබඳ අනුමාන කෙරෙයි. මෙම ලිපියේ දී අවධානය යොමු කෙරෙනුයේ ඍජුවම දින වකවානු දක්වා ඇති පුස්කොළ පොත් රචකයින් ඒවා දැක්වීමේ දී අනුගමනය කර ඇති ක්‍රම පිළිබඳ විමර්ශනය කිරීම යි.

ත්‍රිපිටක පුස්කොළ පොත් රචකයින් රචිත කාලය දැක්වීමේ දී ප්‍රධාන වශයෙන් ක්‍රම පහක් අනුගමනය කර තිබේ. එනම් 1. පරිනිර්වාණයෙන් පසු බුද්ධවර්ෂ ගණනය 2. බුද්ධත්වයට පත්වීමේ සිට බුද්ධ වර්ෂ ගණනය 3. ශක වර්ෂ 4. චූලශක වර්ෂ සහ 5. කලියුග වර්ෂ වශයෙනි. මෑත කාලයේ රචිත පුස්කොළ පොත්වල ව්‍යවහාර වර්ෂ, රාජ්‍ය වර්ෂ හෙවත් ක්‍රිස්තු වර්ෂ මඟින් කාලය දක්වා තිබේ.

## බුද්ධ වර්ෂයෙන් කාලය දැක්වීම

ථෙරවාද ත්‍රිපිටක පුස්කොළ පොත්වල මූලික වශයෙන් විද්‍යමාන කාලය දැක්වීමේ ක්‍රමය බුද්ධ වර්ෂයෙන් කාලය දැක්වීමයි. බුද්ධ වර්ෂ අනුව දින දැක්වීමේ දී ක්‍රම දෙකක් අනුගමනය කර තිබේ.

විනය පිටකය, දීපවංසය, මහාවංසය වැනි ඓතිහාසික මූලාශ්‍රයවලට අනුව බුද්ධ වර්ෂය ආරම්භ වන්නේ බුද්ධ පරිනිර්වාණයේ සිට ය. බුද්ධ පරිනිර්වාණය සිදුවනුයේ ක්‍රිස්තු පූර්ව 543 දී බව බොහෝ විද්වතුන්ගේ පිළිගැනීම යි. බුද්ධ වර්ෂය ආරම්භ වනුයේ මැයි (වෙසක්) මස පසළොස්වක දින සිට ය. මූලාශ්‍රය අනුව සිද්ධාර්ථ උත්පත්තිය සිදුවනුයේ ක්‍රිස්තු පූර්ව 624 දී ය. සිද්ධාර්ථයන්ගේ අභිනිෂ්ක්‍රමණය උත්පත්තියෙන් අවුරුදු 29 ක් ඇවෑමෙන් සිදුවිය. එනම් ක්‍රිස්තු පූර්ව 595 (624-29=595) දී ය. බෝසත්හු සම්බුද්ධත්වය 35 වෙනි වියේ දී පසක් කර ගත්හ. එනම් ක්‍රිස්තු පූර්ව 589 (624-35=589) දී ය. සම්බුද්ධත්වයෙන් පසුව බුදුරජාණන් වහන්සේ 45 වසරක් ධර්ම ප්‍රචාරයෙහි නිරත විය. එනම් ක්‍රිස්තු පූර්ව 544 (589-45=544) තෙක් ය. උත්පත්තියේ සිට ආයු කාලය ගණනය කිරීමෙන් (624-80=544) වර්ෂ නිර්ණය කර ගත හැකිය.[1] එහෙත් බුද්ධ වර්ෂ ගණනය කරනුයේ සම්බුද්ධ පරිනිර්වාණය සිදු වූ වෙසක් පොහෝ දින සිට හෙයින් ක්‍රිස්තු පූර්ව 543 ලෙස සැලකීම පොදු පිළිගැනීම යි.

බුද්ධ වර්ෂ දැක්වීමේ දෙවෙනි ක්‍රමය බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත් වූ දින සිට කාලය දැක්වීමයි. එහි දී සම්බුද්ධ පරිනිර්වාණය සිදු වූ ක්‍රිස්තු පූර්ව 543 ට වර්ෂ 45 ක් එකතු කරනු ලැබේ. ඒ අනුව බුද්ධ වර්ෂ ගණනය කරනුයේ ක්‍රිස්තු පූර්ව 588 (543+45) ක් වශයෙනි. මෙම ගණනය කිරීම සිදුවනුයේ ද වෙසක් පොහෝ දින සිට ය.

පුස්කොළ පොත් කිහිපයක් විමසීමෙන් කාලය දැක්වීමේ දී භාවිත බුද්ධ වර්ෂ ක්‍රමය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගත හැකිය. මධ්‍යම පළාතේ මහනුවර, මැදවෙල විහාරස්ථානයෙහි ඇති දක්ඛිණාවිභඞ්ග සූත්‍ර පුස්කොළ පිටපතෙහි රචිත කාලය දැක්වීම සඳහා පිටපත්කරුවා යොදා ගනුයේ බුද්ධ වර්ෂයයි. බුද්ධ වර්ෂ මඟින් පමණක් කාලය දැක්වීමේ දී රචකයාගේ ශ්‍රද්ධා ගුණයත් එක් කරමින් කාලය දැක්වීමට උත්සාහ ගන්නා ආකාරයක් ද දැකිය හැකිය. ලේඛකයා ලියා ඇති ආකාරයෙන් ම එය දැක්වෙන්නේ මෙසේයඃ '**ශ්‍රී සුගත තථාගත ධර්මචක්‍රවර්ති ස්වාමිවූ සර්වඥරාජොත්තමයානණ් වහන්ශෙගේ වර්ෂ ප්‍රමානයෙන් දෙදස්තුන්ශිය අනූභයට පැමිනි වෙසක්මස**

**පුරපසලොස්වක් ලත් සඳුදා මැදවල විහාරෙ උපොසථාගාරයෙහි දී තොරදෙනියෙහි හංගිඩිගෙදර අප්පුනයිදෙ වන මා විශිං ලියවා බරපැන් අරවා ශියළු ලවුකික සම්පත් හා ලෝකෝත්තර වු නෙර්වාන සම්පත් ලබනු සදහා සාංගීක කොට මෙපොත්වහන්ශේ පූජාකලාය'**[2] පුස්කොළ පිටපත අවසානයේ දක්වා ඇති මෙම පාඨය අනුව මෙය රචනා කොට සියලු කටයුතු නිමකර ඇත්තේ බුද්ධ වර්ෂ 2396 වෙසක් පොහෝ දින දී ය. එනම් ක්‍රිස්තු වර්ෂ (2396-543) 1853 දී ය.

බුද්ධ වර්ෂ මගින් කාලය දැක්වීමේ දී නක්ෂත්‍ර ක්‍රමය අනුව දින වකවානු ඉදිරිපත් කිරීම ද ඇතැම් පුස්කොළ පිටපත්වලින් හමුවේ. කුණ්ඩසාලේ ශ්‍රී නරේන්ද්‍රසිංහ රජමහා විහාරයෙහි දීඝනිකාය පුස්කොළ පිටපතෙහි මෙම ලක්ෂණ ඇතුළත් කරමින් කාලය දක්වා ඇත්තේ මෙසේය. **'කුඹල්ගම ජෙතුත්තර උන්නාන්සේගේ සිශ්‍ය වූ අයගම අත්ථදස්සී උන්නාන්සෙ විසින් ගාලුකෝරලේ වැලිතර තොටමුනේ කොස්ගොඩ රමානිස් මැන්ඩිස් අප්පු විසින් ලියා නිමකරන්ඩ යෙදුනේ ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදාස් තුන්සිය අනූ අටට පැමිනි වරුසෙ තුලා රවි තුන්භාග පුර අටවක පෝට ලත් ගුරු දිනදීය.'**[3] එනම් බුද්ධ වර්ෂ 2398 වැන්නෙහි තුලා රාශියෙහි පුර අටවක පෝය පැමිණි ගුරු දින හෙවත් බ්‍රහස්පතින්දා දිනයෙහි මෙහි රචනා කටයුතු නිම කර තිබේ. එනම් ක්‍රිස්තු වර්ෂ (2398-543) 1855 දීය.

කොළඹ ජාතික පුස්තකාල කෞතුකාගාරයේ මජ්ඣිමනිකාය පුස්කොළ පිටපත ලියූ කාලය දක්වා ඇත්තේ ද බුද්ධ වර්ෂ මගිනි. එදා සුගත වර්ෂ වශයෙනි. සිංහල වර්ෂ සහ දින දැක්වීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් මෙහි කාලය දැක්වූයේ මෙසේය. **'ශ්‍රී ශබ්ම් හත්සිය පණස් අටට පැමිනි මෙම වස සුගත වර්ෂප්ප්‍රමාණයෙන් දෙදාස් තුංසිය හැත්තෑ අටට පැමිණී මෙම වස වෙසක් මස පුර පෑලවිය ලත් සදු දින මෙදවසදෙව මැදි මැදපත්තුවෙ බදකටුවන්නා ගංදහය බදකරඹේ වත්තෙගෙදර මුදියංසේගෙ මුණුබුරා වන කරඹේ ලොකු වෙදරාලගෙ සහාජාත පුත්‍ර වු මම කෝන්වැවෙ සංඝරක්ඛිත ස්ථවිරයං වහංසෙගෙ සිශ්‍ය ගෝල වූ කරඹේ කුඩාවෙදරාල වන මා විසින් අප බුදුං සතුන්හට නිවන් දෙන එක්ෂිය දෙපනස් සූත්‍රයකිං සඞ්‍ග්‍රහීත වූ මැදුං සඟිය නෙර්වාන සම්පත් පිණිස ලියා සාමාප්ත**

**කලාභුය.**[4] මෙම විස්තරයට අනුව ශක වර්ෂ (1)758 දී හෙවත් බුද්ධ වර්ෂ 2378 වෙසක් මස පුර පෑළවිය ලත් සඳු දින පිටපත් කරන ලද පුස්කොළ පිටපතක් වශයෙන් කාලය දක්වා තිබේ. ඒ අනුව එය ක්‍රිස්තු වර්ෂ 1836 ට අයත් සම්පූර්ණ මජ්ඣිමනිකාය පිටපතකි.

වාද්දූව මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන් පුස්තකාලයෙහි ඇති මජ්ඣිමනිකාය ලියවා ඇත්තේ ශ්‍රද්ධාවන්ත උපාසිකාවක විසිනි. බුද්ධවර්ෂ 2427 වැන්නෙහි ඉල් මස පසළොස්වක කුජ දින මෙහි සියලු කටයුතු නිමවා පූජා කර තිබේ. ඒ බව දැක්වූයේ මෙසේය. **ශ්‍රී සද්ධර්මවර චක්‍රවර්ත්තිස්වාමී සර්වඥයන් වහන්සේ විසින් සුදෙශිත නිකාය පඤකය අතුරෙන් මේ මජ්ඣිමනිකාය පොත්වහන්සේ ශාෂණාභිලාසී භික්ෂූන් වහන්සේලාට උද්ග්‍රහණධාරණාදි වශයෙන් ප්‍රයෝජන වීම පිණිස මෙහි පහත නම් පේන මා විසින් මතු නිර්වාණාමෘතය ලබනු සඳහා ලියවා බොහෝ ශ්‍රධාවන්ත සමූහයාගේ ආධාර ඇතුව බැර පන ගෙවා රයිගම ඉන්දජොති සාමීන් වහන්සේගේ භාරයෙහි තබන්ට යෙදුනේ ශ්‍රී බුධ වර්ෂයෙන් දෙදාස් සාරසිය සත්විසි වන ඉල්මස පුර පසලොස්වක ලත් කුජ දින අතුකෝරලගේ මැනික්සාමි නමැති දසසිල් උපාසිකාව විසින.**[5]

දකුණු පළාතේ දෙවිනුවර, කපුගම සුධර්මාරාම විහාරයට අයත් මජ්ඣිමනිකාය පිටපතෙහි රචිත කාලය දැක්වූයේ පාලි පාඨයක් මගින් බුද්ධ වර්ෂ දැක්වීමෙනි. **සම්මාසම්බුද්ධස්ස පරිනිබ්බාණතො චතුසතාධිකො ද්විසහස්සපඤ්චපන්නාසතිමෙ ගච්චගින්ද්‍රියම්බුධිලොචනෙ වස්සෙ නික්ඛමනීයොමාසෙ මජ්ඣිමනිකායොචායං ලිඛිත්වා නිට්ඨිතො මයා ති ඤාතබ්බො.**[6] මෙම වර්ෂ දැක්වීමට අනුව මෙය පිටපත් කර ඇත්තේ බුද්ධ වර්ෂ 2455 (චතුසතාධිකො ද්විසහස්සපඤ්චපන්නාසතිමෙ) දී හෙවත් ක්‍රිස්තු වර්ෂ (2455-543) 1912 දී පමණය.

ඌව පළාත වනාහි ඉතා දුලභව ත්‍රිපිටක පුස්කොළ පොත් හමුවෙන පළාතකි. ඒ අතුරින් විදුරුපොල ශ්‍රී සුමංගලාරාමය වැදගත් වන්නේ එහි වැඩසිටි සුප්‍රකට පාලි විද්වතෙකු වන විදුරුපොල පියතිස්ස මහානායක මාහිමිපාණන් වහන්සේ විසින් සංරක්ෂණය කරන ලද විශාල පුස්කොළ

පොත් සමූහයක් එහි දක්නට ඇති බැවිනි. ඇතැම් පුස්කොළ පොත් උන්වහන්සේ විසින් පිටපත් කරන්නට ඇති අතර තවත් සමූහයක් විවිධ ස්ථානයන්ගෙන් උන්වහන්සේට තෑගි පිණිස හෝ පර්යේෂණය පිණිස ලබා දුන් ඒවා වේ. එහි සුරක්ෂිතව ඇති මජ්ඣිම නිකාය වූ කලී ඉතා විසිතුරු ලියවැලකින් අලංකෘත කම්බා යුග්මයකින් බැඳ තිබේ. එක් කම්බයක මධ්‍යයෙහි '**මැදුං සඟිය**' යනුවෙනුත් අනිත් කම්බයෙහි '**බුධවර්ෂයෙං 2417**'[7] යනුවෙන් පිටපතෙහි නාමයත් පිටපත් කාලයත් සඳහන් කෙරේ.

පරිවාර පාලි පුස්කොළ පිටපතක චන්ද්‍රමාස ක්‍රමය අනුග මනය කරමින් බුද්ධ වර්ෂ දක්වා ඇත්තේ පාලි භාෂා මාධ්‍යයෙනි. එය දින වකවානු දැක්වීමේ දී කතුවරුන් උපයෝගී කරගත් තවත් ක්‍රමවේදයක් වේ. '**පරිච්චතමිදං බුද්ධස්ස භගවතො පරිනිබ්බානතො චතුසතාධිකානං ද්වින්නං වස්ස සහස්සානමුපරිචුද්දදසසු ච සංවච්ඡරෙසු අතික්කන්තෙසුවත්තමාම සංවච්ඡරෙ මාස මාස සුක්කපක්ඛ දසචියායුත්තෙ භුම්මවාසරෙ**' යනුවෙනි. බුද්ධ වර්ෂ 2414 දී මාස හෙවත් නවම් මස ශුක්ල පක්ෂයෙහි හෙවත් අමාවක දිනයෙහි මෙහි රචනා කටයුතු නිමකර ඇති අයුරු එහි දැක්වේ.

මේ අනුව බොහෝ ත්‍රිපිටක පොත්වල රචිත කාලය දැක්වීමේ දී භාවිත කර ඇත්තේ බුද්ධ වර්ෂ යි. එකල සමකාලීන සමාජයේ භාවිත වර්ෂ දැක්වීමේ ක්‍රමවේදය වූයේ ද බුද්ධ වර්ෂ විය හැකිය. වර්තමානයේ ද බොහෝ ආගමික ලේඛනවල කාලය දක්වනුයේ බුද්ධ වර්ෂ මඟිනි. එසේම ලංකාවටත් වඩා ජාතික, ආගමික කටයුතුවල දී පවා තායිලන්තයෙහි බුද්ධ වර්ෂ භාවිතය බෙහෙවින් දැකිය හැකිය.

## ශක වර්ෂයෙන් කාලය දැක්වීම

ලාංකේය පුස්කොළ පොත්වල ශක වර්ෂ ගණනය සිදුකෙරෙනුයේ ක්‍රිස්තු වර්ෂ 78 වෙනි වර්ෂයේ සිට ය. ශක රාජ පරම්පරාවේ ආරම්භය ලෙස සැලකෙනුයේ ඉන්දියාවේ කණිෂ්ක රජුගේ පටන් ය. ශක වර්ෂය ආරම්භ වනුයේ අප්‍රේල් මස (බක්) 13 වෙනි දින සූර්යයා මේෂ රාශියේ සිට මීන රාශියට සංක්‍රමණය වන දිනය සලකාගෙන ය. මෙහි දී මාස ගණනය කිරීම ක්‍රම දෙකකට සිදු වේ. එනම් සූර්ය මාස ක්‍රමය සහ

චන්ද්‍ර මාස ක්‍රමය වශයෙනි. චන්ද්‍ර මාස ක්‍රමයට අනුව සිංහල, පාලි, සංස්කෘත සහ බුරුම භාෂාවලින් මෙන්ම ඉංග්‍රීසි ක්‍රමයට අයත්වන ආකාරයට වර්ෂයෙහි මාස 12 ගණනය කරනුයේ මෙසේය.[8]

| සිංහල | පාලි | සංස්කෘත | බුරුම | ඉංග්‍රීසි |
|---|---|---|---|---|
| බක් | චිත්ත | චෛත්‍ර | තගු | මාර්තු-අප්‍රේල් |
| වෙසක් | වෙසාඛ | වෛශාඛ | කසොන් | අප්‍රේල්-මැයි |
| පොසොන් | ජෙට්ඨ | ජ්‍යෙෂ්ඨ | නයොන් | මැයි-ජූනි |
| ඇසළ | ආසාළ්හ | ආෂාඪ | වාසො | ජූනි-ජූලි |
| නිකිණි | සාවණ | ශ්‍රාවණ | වගවුන්ග් | ජූලි-අගෝස්තු |
| බිනර | පොට්ඨපාද | භද්‍ර | තව්ථලින් | අගෝස්තු-සැප්තැම්බර් |
| වප් | අස්සයුජ | අශ්වින් | ථදින්ග්ජත් | සැප්තැම්බර්-නොවැම්බර් |
| ඉල් | කත්තිික | කාර්තිඛ | තශවුන්ග්මොන් | නොවැම්බර්-දෙසැම්බර් |
| උඳුවප් | මාගසිර | ආග්‍රහාරණ | නතව් | දෙසැම්බර්-ජනවාරි |
| දුරුතු | ඵුස්ස | පෞෂ | ප්‍යාථො | ජනවාරි-පෙබරවාරි |
| නවම් | මාඝ | මාඝ | තබොද්වෙ | පෙබරවාරි-මාර්තු |
| මැදින් | ඵග්ගුන | ඵාල්ගුන | තබවුන්ග් | මාර්තු-අප්‍රේල් |

චන්ද්‍ර මාස ක්‍රමයට අනුව දින ගණිනු ලබන්නේ පළමු, දෙවෙනි, තෙවෙනි වශයෙන් පුර පසළොස්වක සිට අනුක්‍රමයෙන් සඳ අව ප්‍රමාණය වීම දක්වා දින 15 ක් ද පුර සඳ සිට පුර පසළොස්වක දක්වා හෙවත් අමාවක දින සිට අනුක්‍රමයෙන් සඳ අනුප්‍රමාණය වීම අනුව 16 දිනක් වශයෙන් මාසයට දින 31 ක් ගණනය කිරීමෙනි. චන්ද්‍ර මාස ක්‍රමයට අනුව දින දක්වනුයේ මෙසේය.[9] එනම් පෑලවිය, දියවක, තියවක, ජලවක, විසෙනිය, ශටවක, සතවක, අටවක, නවවක, දසවක, එකළොස්වක, දොළොස්වක, තෙළෙස්වක, තුදුස්වක, අමාවක, පසළොස්වක වශයෙනි.

සූර්ය මාස ක්‍රමයට අනුව මාස හැඳින්වූයේ රාශිවල නම් භාවිත කරමිනි. දින හැඳින්වූයේ තිථි නමිනි. පළමු දෙවෙනි තෙවෙනි වශයෙන් තිථි 31 ක් මාසයකට ඇතුළත් වූ අතර සූර්ය මාස හැඳින්වූ රාශි හෙවත් ලග්න මෙසේය. එනම් 'මේෂ, වෘෂභ, මිථුන, කටක, සිංහ, කන්‍යා, තුලා, වෘශ්චික, ධනු, මකර, කුම්භ, මීන' යනුවෙනි.

සූර්ය මාස ක්‍රමයේ දී නක්ෂත්‍ර යෝගවලින් ද දින නම් කරනු ලැබේ. චන්ද්‍රයා ප්‍රධාන නක්ෂත්‍ර (තාරකා) 27 ක් පසුකරමින් ගමන් කරන අතර ඒ අනුව පළමු වෙනි නක්ෂත්‍රය (නැකත) අශ්විනී නමින් හැඳින්වුණ අතර නැකත් 27 කින් යුක්ත වේ. බොහෝ පුස්කොළ පොත්වල දින වකවානු සඳහන් කිරීමේ දී භාවිත කෙරෙනුයේ මෙම නැකැත් නාමයන් පදනම් කරගනිමිනි. ඒවා මෙසේය.[10] 'අස්විනි, භරණි, කෘත්තික, රෝහණී, මෘගශීර්ෂ, අර්ද්‍ර, පුනර්වස, පුෂ්‍ය, අස්ලිස, මඝ, ඵල්ගුනි, උත්තර ඵල්ගුනි, හස්තබ්, චිත්‍ර, මරුත්, විසාඛ, අනුරාධ, ජ්‍යෙෂ්ඨ, මූල, ආෂාඪ, උත්තරාෂාඪ, ශ්‍රවණ, ධනිස්ඨ, වැරනි, භද්‍රපද, උත්‍රභද්‍රපද, රේවතී' යනුවෙනි.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. බ්‍රහ්ම විංශතිය | | | | | |
| විෂ්ණු යුග | 1. ප්‍රභව | 2. විභව | 3. ශුක්ල | 4. ප්‍රමෝද | 5. ප්‍රජාපති |
| බ්‍රහස්පති යුග | 6. අංගීර | 7. ශ්‍රී මුඛ | 8. භාව | 9. යුවාන් | 10. ධාතෘ |
| ඉන්ද්‍ර යුග | 11. ඊශ්වර | 12. බහුධාන්‍ය | 13. ප්‍රමාර්ථ | 14. වික්‍රම | 15. වෘස |
| අග්නි යුග | 16. චිත්‍රභානු | 17. සුභානු | 18. තාරණ | 19. පාර්ථව | 20. ව්‍යය |
| 2. විෂ්ණු විංශතිය | | | | | |
| බ්‍රහ්ම යුග | 21. සර්වජිත් | 22. සර්වධාරී | 23. විරෝධි | 24. විකෘති | 25. ඛර |
| ශිව යුග | 26. නන්දන | 27. විජය | 28. ජය | 29. මන්මථ | 30. දුර්මුඛ |
| පිතර යුග | 31. හේමලම්බි | 32. විලම්බි | 33. විකාරී | 34. සාර්වරී | 35. ප්ලව |
| විශ්වදෙ යුග | 36. සුභකෘත් | 37. සෝභන | 38. ක්‍රෝධි | 39. විස්වාවිසූ | 40. පරාභව |
| 3. ඊශ්වර විංශතිය | | | | | |
| චන්ද්‍ර යුග | 41. ප්ලවංග | 42. කීලක | 43. සෞම්‍ය | 44. සාධාරණ | 45. විරෝධකෘත් |
| ජ්වලන යුග | 46. පරිධාවි | 47. ප්‍රමාධි | 48. ආනන්ද | 49. රාක්ෂස | 50. අනල |
| අස්විනී කුමාර යුග | 51. පිංගල | 52. කාලදේහ | 53. සිද්ධාර්ථ | 54. රෞද්‍ර | 55. දුර්මතී |
| සූර්ය යුග | 56. දුන්දුභී | 57. රුධිරෝද්සරී | 58. රක්තාක්ෂි | 59. ක්‍රෝධන | 60. ක්ෂය |

ශක යුගය වර්ෂ 60 කින් යුක්ත චක්‍රයක් වන අතර ඒ එක් එක් වර්ෂයකට විශේෂ නමක් භාවිත කෙරේ. එක් චක්‍රයක් තුළ වර්ෂ 20 බැගින් විංශති කාල තුනකි. එනම් බ්‍රහ්ම, විෂ්ණු සහ ඊශ්වර වශයෙනි. නැවත වර්ෂ 60 කින් යුක්ත චක්‍රය යුග 12 කටත් නැවත එක් එක් යුග වර්ෂ 5 කටත් බෙදනු ලැබේ.[11]

ශක යුගයේ පළමු වර්ෂය ලෙස චක්‍රයේ 12 වැන්න සැලකේ. ශක වර්ෂවලින් දිනය දැක්වීමේ දී වර්ෂයේ අංකය, විංශතියේ නම, යුගයේ

නම සහ වර්ෂයේ නම සඳහන් කෙරේ. 1859 යනු බ්‍රහ්ම විංශතියේ, ඉන්ද්‍ර යුගයේ, ඊශ්වර කාලයයි. ඇතැම් පුස්කොළ රචකයෝ වර්ෂයේ නම සඳහන් කරන තැන්වල යුග පළමු දෙවෙනි තෙවෙනි සිව්වෙනි සහ පස්වෙනි වශයෙන් ගණනය කර යුගයේ නම පමණක් සඳහන් කරති. යුගයක වර්ෂ පහ හැඳින්වීම සඳහා විශේෂ නාම භාවිත වූ අතර ඒවා සංවත්සර, පරිවත්සර, ඉද්ධ, අනු සහ ඉත් යනුවෙන් හැඳින්වුණි.

මෙම චන්ද්‍ර සහ සූර්ය මාස අනුගමනය කරමින් ශක වර්ෂ දැක්වීම පුස්කොළ පිටපත්වල සුලබ ලක්ෂණයකි. දැනට බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තැන්පත් කර පුස්කොළ පොත් අතර ඇති තෙසකුණ ජාතක පද ඇනුම නම් පුස්කොළ පොතෙහි මෙම ලක්ෂණ අනුගමනය කරමින් රචිත කාලය දක්වා ඇත්තේ මෙසේයඃ **'ශ්‍රී සුද්ධ සකරාජ වර්ෂයෙන් 1757 ට පැමිණි මෙම වර්ෂයෙහි නවම් මස පුර තෙලෙස්වක නම් තිථිය ලත් ගුරු දින ප්‍රවර මාතර පුර ප්‍රවරයෙහි වැලිගන් කෝරලේට අයිති ගැඹුරේගොඩ ඉන්ද්‍රජෝති භික්ෂූන් විසින් ලියා නිමවන ලදී. කෙසේ ආරාධනාවෙන් ද යත්, විසුද්ධ බුද්ධීන් ප්‍රසිද්ධ සවු සීලගුණාලංකාර කඳුරුවෙව දේවරක්ඛිත ස්ථවිරපාදයානන්වහන්සේගේ ආරාධනාවෙන් ලියා නිමවන ලදී. අන්තිමකාලෙ වර්ෂ 1835, සක වර්ෂ 1757.'**[12] යනුවෙනි. මෙහි අන්තිම කාලෙ වර්ෂ යනුවෙන් දක්වන්නට ඇත්තේ (1757+78=1835) ක්‍රිස්තු වර්ෂයි.

බොහෝ පුස්කොළ පිටපත් රචකයින් මෙම නක්ෂත්‍ර ක්‍රමයට අනුව රචිත කාලය දැක්වීමට රුචියක් දක්වා ඇති බව පෙනේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල පුස්කොළ එකතුවෙහි ඇති මිළින්දපඤ්හයෙහි ද කාලය දක්වා ඇත්තේ මේ ලක්ෂණ අනුගමනය කරමිනි. **'ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදහස් හාරසිය විසිතුනක් වූ සංවත්සරයෙහි මාඝ මාසයෙහි ෂෂ්ටමී තිථිය ලත් ක්ෂුවුවාරයෙහි ලිපිකර තබන ලදි'**[13] එනම් බුද්ධ වර්ෂ 2423 දී ය (ක්‍රිස්තු වර්ෂ 2423-543=1880), මාඝ මාස යනු නවම් හෙවත් පෙබරවාරි මසයි.

පජ්ජමධු සන්න පිටපතක් රචනා කළ මහා සංඝතිස්ස නම් හිමිනමක් එය පිටපත් කළ වර්ෂය සංඛ්‍යාවෙන් පළමුව සඳහන්

කර නැවත එය පාලියෙන් ම චන්ද්‍ර සූර්ය මාස ක්‍රමයට අනුව දින වකවානු ඉදිරිපත් කරයි. '**වර්ෂ 1863. 3. 9 දින දීය. බුද්ධස්ස භගවතො පරින්බ්බානතො ද්වීසු වස්ස සහස්සෙසු චතුසුව වස්සසතෙසු ඡසු සංවච්ඡරෙසු අතික්කන්තෙසු ඵග්ගුණ මාසස්ස කාලපක්ඛ සොමවාරෙ දසමෙ ලිඛාපිතායං මහා සංඝතිස්සාභිධානෙන පජ්ජමධු**'[14] යනුවෙනි. ඵග්ගුණ මාස යනු පෙබරවාරි 15 සිට මාර්තු 15 දක්වා කාලයයි. කාලපක්ඛ යනු කළුවර පක්ෂය හෙවත් අමාවක යි. සෝමවාර යනු සඳුදා යි. දසමෙ යනු 10 වෙනි දා යි. එනම් බුද්ධ වර්ෂ (1863+543) 2406 දී ය.

රචිත කාලය නැකත් ශාස්ත්‍රයට අනුව හඳුන්වාදීමට බොහෝ පුස්කොළ රචකයන් රුචියක් දක්වා ඇත. එසේ නැකතට අනුව ස්වකීය පිටපත රචනා කොට නිම වූ බව පැහැදිලිව දක්වන අයුරු නිමි ජාතක පුස්කොළ පිටපතින් දැකිය හැකිය. '**ශ්‍රී ලංකේශ්වර වූ උතුම් ත්‍රිසිංහලාධිපති රාජාධිරාජසිංහ නම් දෙව් මහරානෝ සෙංඛඩ නම් පුරවරයෙහි රාජ ශ්‍රී පාලනය කරණ සමයෙහියි ශ්‍රී සුද්ධ සකරාජ එක්වාදහස් හත්සිය විස්සට පැමිණි මෙම වර්ෂයෙහි පරවහ පත්තුවේ ශැමදෙනා ඇතුළුව ඉපුල්වැහැර උපාසකවරුන් හා සමග කරවිලගල පියදස්සී නම් තෙරුන්වහන්ෂේට ආරාධනා කොට එම උන්වහන්සේලාගේ ශිෂ්‍ය වූ පරවහගම ගුණරතන භික්ෂූන් වහන්සේ විශින් බිඹරමශ අවතියවක ලත් කිවිදින බෙරනේ නැකතයෙන් ලියා නිමි ජාතකේ පොත් වහන්ෂෙයි**' එනම් ශක වර්ෂ 1720 යනු ක්‍රිස්තු වර්ෂ (1720+78) 1798 දීය. බිනර මස යනු සැප්තැම්බර් මසයි. කිවි දින හෙවත් සිකුරාදා දින බෙරන නැකතින් මෙහි රචනා කටයුතු නිමවූ වග සඳහන් කරයි.

ශ්‍රී දළඳාමාළිගාව පුස්තකාලයෙහි ඇති අංගුත්තරනිකාය පුස්කොළ පිටපතක බුද්ධ වර්ෂත්, ශක වර්ෂත් ක්‍රිස්තු වර්ෂත් උපයෝගී කරගනිමින් කාලය දක්වා තිබේ. එහි ශක වර්ෂවලින් දිනයන් දැක්වීමේ දී චන්ද්‍ර සූර්ය මාස ක්‍රමය යොදාගෙන තිබේ. '**ශ්‍රී බුද්ධවර්ෂයෙන් දෙදායහාරසිය විසිනවයයි, සකවර්ෂයෙන් එකදස්අටසිය අටක් වූ මේස රවි අටභාගයක් ගත වූ බක් මස පුරපසලොස්වක් පෝය දිනදීය, ක්‍රිස්තු වර්ෂ 1886ක් වූ අප්පියෙල් මාසේ 16 වෙනි දින දීය.**[15]

ඇතැම් පුස්කොළ පොත් රචකයින් ස්වකීය පිටපත රචනා කළ කාලය දැක්වීමේ දී ඉතිහාසමය තොරතුරු ද අන්තර්ගත කරමින් ඉදිරිපත් කරන ආකාරයක් ද දැකිය හැකිය. දැනට කුරුණෑගල රිදී විහාරයෙහි ඇති දීඝනිකාය පුස්කොළ පිටපතක ශක වර්ෂ මගින් කාලය දක්වා ඇත්තේ එකල සමාජීය පසුබිම පිළිබඳව ද කරුණු ඇතුළත් කරමිනි. **'ලංකාද්වීපයෙහි ශ්‍රී විජයරාජසිංහ නම් මහරජානො රජකරන ප්‍රස්ථාවෙහි බොහෝ කාලයෙක පටන් පිරිහෙන්ටවන් පරියාප්තිකප්‍රතිපත්ති ශාසනය දීප්තිමත් කොට බබුලුවා ලෝවැඩ කලාවූ ලක්දිවට ධජයක්ව තිබූ ඡන්දස් ව්‍යාකරණ ආදී වූ බොහෝ ශාස්ත්‍රයෙහි හා ත්‍රිපිටක බුද්ධවචනයෙහි දක්ස වූ ලොවට පින් කෙතක් වැනි වූ උපවසථාරාමවාසී වූ සරණංකර සිස්ස වූ තිබ්බටුවාවේ සාමණේර තැන විසින් තමන්ට සම්‍යක් සම්බෝධිය පිණිස හා ලෝ සසුන් වැඩ පිණිස සකවර්ස එක්වාදහස් සයසිය සැටසයට පැමිණි වර්සයෙහි ලියවූ දික්සඬගියයි.'**[16] මෙම කර්තෘ කාල සන්දේශයට අනුව කීර්ති ශ්‍රී රාජසිංහ නිරිඳුන් රාජ්‍ය කරන කාලයෙහි ශාස්ත්‍ර අභිවෘද්ධිය වෙනුවෙන් සරණංකර සංඝරාජයාණන් වහන්සේගේ ශිෂ්‍ය වූ තිබ්බටුවාවේ නම් සාමණේර හිමියන් විසින් ශක වර්ෂ 1666 දී එනම් ක්‍රිස්තු වර්ෂ (1666+78) 1744 දී මෙය රචනා කොට තිබේ. දැනට ලක්දිව ඇති පැරණිතම පුස්කොළ පිටපත් අතුරින් එකක් ලෙස මෙය සැලකිය හැකිය.

වයඹ පළාතේ නිකවැරටිය බුදුමුත්තාව රජමහා විහාරයට අයත් මජ්ඣිමනිකාය පිටපත රචිත කාලය දක්වා ඇත්තේ ද ශකවර්ෂ අනුගමනය කරමිනි. **'මේ මැදුං සඟිය ලියා නිමකෙලේ සිදු(දා?)ගම සිද්ධාර්ථ භික්‍ෂූන්වහන්සේ වම්හ. සිද්ධිරස්තු. සුභමස්තු. ඉෂ්ටාර්ත්ථසිද්ධිරස්තු. මේ ලිය වූ පිනිං මම ද බුදුවෙම්වා ලොවුතුරා. සකවර්ෂ එක්වා දහස් හත්සිය අසූහතයි. වෙසක් මස පුර තෙලෙස්වකණං තිථිය ලත් කිවිදිණ ලියා තීන්දු කලාය. පත්ඉරු පන්ෂිය විසි දෙකයි.'**[17] පිටපත්කරුවාගේ නම සිදුගම සිද්ධාර්ථ භික්‍ෂූන් වහන්සේ නමින් දක්වා ඇති අතර කාලය සකවර්ෂ 1787 බැව් දක්වයි. එනම් ක්‍රිස්තු වර්ෂ 1865 පමණය.

## චූල ශක වර්ෂයෙන් කාලය දැක්වීම

බුරුම, සියම් සහ ලන්නා පුස්කොළ පොත්වල භාවිත වී ඇත්තේ චූල ශකවර්ෂ ක්‍රමයයි. චූල ශකවර්ෂ ආරම්භ වනුයේ ලංකා සහ ඉන්දීය ශකවර්ෂ වලට වර්ෂ 560 කට පසුව යි. එනම් ක්‍රිස්තු වර්ෂ 638 දී ය. ශක වර්ෂවල භාවිත වූ සූර්ය මාස, චන්ද්‍ර මාස, දින, පැය ඊට සමානව ගණනය කෙරෙන අතර චූල ශක යුගයේ වර්ෂ 12 කින් සහ 10 කින් යුක්ත චක්‍ර දෙකකට බෙදනු ලැබේ. වර්ෂ 12 කින් යුක්ත චක්‍රය හැඳින්වීමට සත්වයින්ගේ නම් භාවිත කෙරෙණි. එනම් මී, වෘෂභ, ව්‍යාඝ්‍ර, සිංහ, මහාමකර, කුඩා මකර, අශ්ව, එළු, වඳුරු, කුකුළු, සුනඛ සහ ඌරු වශයෙනි.

වර්ෂ 10 කින් යුක්ත දෙවෙනි චක්‍රයේ එකේ සිට දහය දක්වා අංක ක්‍රමයට දක්වනු ලැබේ. මේවා සමගාමීව ගණනය කිරීමේ දී වර්ෂ 60 ක චක්‍රය තුළ වර්ෂ 10 කින් යුක්ත චක්‍රයේ පළමු වර්ෂය එක වශයෙන් ද වර්ෂ 12 කින් යුක්ත චක්‍රයේ පළමු වර්ෂය මී වර්ෂය ලෙස ද සලකනු ලැබේ.

ලන්නා පුස්කොළ පොත්වල චූලශක වර්ෂවලින් රචිත කාලය දක්වා ඇති අතර එය ක්‍රිස්තු වර්ෂවලට පත්කර ගැනීමට වර්ෂ 638ක් එක් කළ යුතුය. උතුරු තායිලන්තයේ 'වට් සුන්ග් මෙන් ප්‍රැළු' නම් විහාරස්ථ පුස්තකාලයේ ඇති දීඝනිකාය පුස්කොළ පොතක පිටපත් කළ වර්ෂ සඳහන් වනුයේ චූල ශකවර්ෂ 1198 ලෙසයි.[18] එනම් ක්‍රිස්තු වර්ෂ (1198+638) 1836 යනුයි. ලන්නා පුස්කොළ පොත් කොටස් වශයෙන් සංග්‍රහ වී ඇති හෙයින් ඇතැම් විට එකම පොතේ එක් කොටසක් එක් වර්ෂයකත් ඉතිරි කොටස් තවත් වර්ෂවලත් සංග්‍රහ වී ඇති ආකාරයක් ද දැකිය හැකිය. ලන්නා පුස්කොළ පොත් සියල්ල පාහේ භාවිත කරනුයේ චූල ශකවර්ෂ ක්‍රමය උපයෝගී කරගනිමින් දින වකවානු දැක්වීමේ ක්‍රමවේදය යි. වට් ලයි හින් නම් විහාරස්ථානයේ ඇති ලන්නා පුස්කොළ අතර අසම්පූර්ණ ධම්මපදට්ඨකථාවෙහි රචිත කාලය වශයෙන් දක්වනුයේ චූලශකවර්ෂ 883[19] වශයෙනි. එනම් ක්‍රිස්තු වර්ෂ (883+638) 1521 දී ය. මේ අනුව මෙය ද ඉතා පැරණිතම පිටපතකි. එහිම ඇති අසම්පූර්ණ මිලින්දපඤ්හ පුස්කොළ පොතෙහි ද රචිත කාලය වශයෙන් චූලශකවර්ෂ 857[20] වශයෙන් දක්වයි. එනම් ක්‍රිස්තු වර්ෂ (857+638) 1495 දී පමණය. මේ අනුව ඉතා පැරණි ත්‍රිපිටක

පුස්කොළ පිටපත් ලන්නා සම්ප්‍රදායෙහි තවමත් ශේෂව ඇති අයුරු ද දැකිය හැකි විශේෂ ලක්‍ෂණයකි.

බුරුම පුස්කොළ පොත්වල ද බෙහෙවින් රචිත වර්ෂ සඳහන් කර ඇත්තේ චූල ශකවර්ෂවලිනි. මේවායෙහි දැකිය හැකි විශේෂත්වයක් වනුයේ වර්ෂයත් මාසයත් දිනයත් ලියා නිමකරන ලද වේලාවත් ඇතැම් පිටපත්වල සඳහන් කර තිබීමයි. දීඝනිකාය සීලක්ඛන්ධ වග්ගය ඇතුළත් පුස්කොළ පිටපතක දින වකවානු දක්වා ඇත්තේ මෙසේය. චුලශකවර්ෂ 1244 දශවුන්ග්මොන් හෙවත් 8 වෙනි දෙසැම්බර් මස 14 වෙනි බදාදා දින ප.ව. 2 ට ලියා අවසන් කළ බවයි.[21] එනම් ක්‍රිස්තු වර්ෂ (1244+638) 1882 දී ය.

චන්ද්‍ර මාස ක්‍රමයට අනුව සම්බුද්ධත්වය පදනම් කරගනිමින් බුරුම රාජ්‍ය වර්ෂත් බුරුම චූල ශකවර්ෂත් ගණනය කරනුයේ වෙසක් පොහෝ දිනයේ සිට ය. බුරුම රාජ්‍ය වර්ෂ සහ චූලශකවර්ෂ යනු එරට ව්‍යවහාර රාජ්‍ය වර්ෂ ක්‍රමය වීම ද විශේෂත්වයකි. බොහෝ පුස්කොළ පොත්වල එකම ක්‍රමවේදයකට අනුව රචිත කාලය දක්වන ආකාරයක් ද බුරුම සම්ප්‍රදායෙන් දැකිය හැකිය. බුරුමයේ අමරපුර ප්‍රදේශයේ විහාරස්ථ පුස්තකාලයක ඇති දීඝනිකාය සීලක්ඛන්ධ කොටස ඇතුළත් පුස්කොළ පොතෙහි කාලය දක්වනුයේ මෙසේය. එනම් චූල ශකවර්ෂ 1129 දබවුන්ග් හෙවත් 12 වෙනි අප්‍රේල් මස සවස් කාලයෙහි පිටපත් කර අවසන් වූ වග සඳහන් කරයි.[22] එනම් ක්‍රිස්තු වර්ෂ (1129+638) 1767 දී ය.

ඉතා පැරණි බුරුම පිටපත්වල වර්ෂය, මාසය සහ දිනය ඇතුළත්ව ඇතිමුත් වේලාව සඳහන් වීමක් නොමැත. යැංගූන් පුස්තකාලයෙහි ඇති දීඝනිකාය සීලක්ඛන්ධ පිටපත[23] එසේ දින සඳහන්ව ඇති පැරණි පුස්කොළ පිටපතකි. චූල ශකවර්ෂ 1041 වාසෝ මස හෙවත් 4 වෙනි අගෝස්තු මස බදාදා දින පිටපත රචනා කර ඇත.[24] එනම් ක්‍රිස්තු වර්ෂ (1041+638) 1679 දී ය.

කොළඹ කෞතුකාගාරයේ ඇති දීඝනිකාය බුරුම පුස්කොළ පොතක කාලය දැක්වීමේ ක්‍රමවේදය විශේෂ වූවකි. එනම් එහි සිංහල සහ බුරුම සම්ප්‍රදායයන් දෙකෙහිම සම්මිශ්‍රණයෙන් කාලය දක්වා

තිබීමයි. ඒ අනුව මුලින් චූල ශකවර්ෂත් අනතුරුව චන්ද්‍ර මාස ක්‍රමයෙහි නැකැත් ක්‍රමයට අනුව දින වකවානු දක්වා තිබෙන ආකාරයත් දැකිය හැකිය. එනම් චූල ශකවර්ෂ 1194 වාසෝ මස පුරපක්ෂයෙහි 9 වෙනි සිකුරාදා මෙය රචනා කර ඇත. එනම් ක්‍රිස්තු වර්ෂ (1194+638) 1832 දී ය. අනතුරුව නැකැත් ක්‍රමයට අනුව එම දිනය ම සඳහන් කරනු ලැබේ. එනම් '**චතුනවුති අධික සහස්සසත සහායනෙ ආසළ්හිපුණ්ණපක්ඛම්හි නවමෙ සුක්කවාසරෙහි**'[25] යනුවෙනි.

## කලියුග වර්ෂයෙන් කාලය දැක්වීම

කලියුග වර්ෂ ආරම්භ වනුයේ ශකවර්ෂ 3179 කට පූර්වයෙන් ය. කලියුග වර්ෂ ක්‍රිස්තු වර්ෂවලට පරිවර්තනය කර ගැනීම සඳහා වර්ෂ (3179-78) 3101 ක් අඩුකළ යුතුය. ලාංකේය පුස්කොළ පිටපත් රචකයන් කලියුග වර්ෂ ඉතා විරල වශයෙන් සඳහන් කර ඇත. එහෙත් කලියුග වර්ෂවලින් පමණක් රචිත කාලය සඳහන් නොවන අතර ඒ සමග බුද්ධවර්ෂත් ශක වර්ෂත් සමග දක්වා තිබේ. කොළඹ කෞතුකාගාර පුස්තකාලයෙහි ඇති අයකුට ජාතකය තුළ පුස්කොළ පොත් රචකයා කලියුග, බුද්ධ වර්ෂ සහ ශක වර්ෂ යන වර්ෂත්‍රයම රචනා කළ කාලය දැක්වීම සඳහා යොදාගෙන ඇත. '**කලියුග වර්ෂයෙන් සාරදහස් අටසියතුන් අවුරුද්දක් වලන්දා, බුද්ධවර්ෂයෙන් දෙදාස්දෙසිය දහහතර අවුරුද්දක් වලන්දා, සකම්වර්ෂ එක්වාදහස් සසිය අවුරුද්දක් වලන්දා**'[26] එනම් මෙම පිටපත කලියුග වර්ෂ 4803 දීත් බුද්ධ වර්ෂ 2214 දීත් ශක වර්ෂ 1600 දීත් රචනා කළ බව යි.

ඉන්දීය පුස්කොළ පිටපත්වල භාවිත වන තවත් වර්ෂ ක්‍රමයක් වූයේ වික්‍රම වර්ෂයි. වික්‍රම වර්ෂ ක්‍රිස්තු පූර්ව 57 සිට ආරම්භ වේ. එසේම මලබාරයේ භාවිත වන ක්‍රිස්තු වර්ෂ 824 සැප්තැම්බර් මාසයේ සිට ආරම්භ වන කොල්ලම් නම් තවත් යුගයක් වේ. මෙම යුග නාම භාවිතය ලාංකේය පුස්කොළ පොත්වල දක්නට නොමැති අතර ඉන්දියාවේ භාවිත යුගයන් වේ.

## ක්‍රිස්තු වර්ෂයෙන් කාලය දැක්වීම

19 වෙනි සියවසෙන් පසුව රචනා වන බොහෝ පුස්කොළ පිටපත්වල දැකිය හැක්කේ ක්‍රිස්තු වර්ෂවලින් කාලය දැක්වීමය. ඇතැම්

විට වර්ෂයත් මාසයත් දිනයත් ඉලක්කම් මඟින් පමණක් දක්වා ඇත. විටෙක වචන මගින් පිටපත් කළ දිනය දක්වයි. වෙස්සන්තර ජාතක ටීකා පිටපත් රචකයා කාලය දක්වා ඇත්තේ ක්‍රිස්තු වර්ෂ දක්වමිනි. **'ක්‍රිස්තු වර්ෂයෙන් එක්වා දහස් අටසිය අනූතුනක් වූ සැප්තැම්බර් මස තිස්වෙනි සනිදින ලිඛිතකරණ ලදී'**[27] එනම් ක්‍රි.ව. 1893 සැප්තැම්බර් 30 සෙනසුරාදා දින දීය.

වයඹ පළාතේ බමුණාකොටුව, කඩිහාර ශ්‍රී විජයසුන්දරාරාමයට අයත් මජ්ඣිමනිකාය පිටපත ආරම්භයේ දීම අතිරේක පත්ඉරුවක් එක්කරමින් රචිත වර්ෂය 1877 වශයෙනුත් පිටපත් කරුවා පිළිබඳ පූර්ණ විවරණයකුත් ඉදිරිපත් කෙරේ. මෙහි දැවමය කම්බා යුග්මය බාහිරයෙන් මෙන් ම අභ්‍යන්තරයෙන් ද විසිතුරු සිතුවමින් අලංකාර කර තිබීම ද විශේෂත්වයකි. **'වැලමිටියා ගෙදර භික්ෂූන්වහන්සේගෙ සිසා වූ මාන නොව පැවදි වන පාන පාන ලෙස දිලිසෙමින වාන සැප සිටත එන, වැලමිටියාගෙ ද මාගෙ ගුරුන්වවහන්සේගෙන් දඹලියද්දේ රතනපාල වන මට අයිති වූ මැදුං සඟිය, 18-77'**[28] මෙම තොරතුරුවලට අනුව වැලමිටියා ගෙදර පරම්පරාවට අයිතිව පැවත එන පුස්කොළ පිටපතකි. එසේ ම දඹලියද්ද ග්‍රාමයත් එම සමීපයේම පවතින්නක් බව දැනට හමුවෙන තොරතුරු වලින් ද සනාථ වේ. එබැවින් මෙය මෙම ප්‍රදේශයේ ම පිටපත් වී පැවත එන පුස්කොළ පිටපත් බැව් පැහැදිලිය.

පුස්කොළ රචකයින් පාලි, සිංහල, සංස්කෘත මෙන්ම දමිළ භාෂාව පිළිබඳව ද විශාරදත්වයකින් යුක්තව සිටි බවට දෙමළ වචන භාවිතයෙන් වර්ෂ දක්වා තිබීමෙන් පැහැදිලි වේ. කොළඹ කෞතුකාගාර පුස්තකාලයෙහි ඇති සර්වඥ ගණිතාලංකාරය නම් පුස්කොළ පිටපතෙහි දෙමළ වචනවලින් ක්‍රිස්තු වර්ෂ දක්වා ඇති අයුරු දැකිය හැක. **'ඕරාඉරං එළුනූරු එළුපදු වර්ෂම්, ඕරාඉරම් ඉරුනූරු, වර්ෂ 1850 ක්'** වශයෙන් රචිත කාලය ලෙස ක්‍රි.ව. 1850 බව දක්වා තිබේ.

## කටපයාදි සංඛ්‍යා ක්‍රමයෙන් කාලය දැක්වීම

පුස්කොළ පොත්වල දිනය දැක්වීමට භාවිත විශේෂ ක්‍රමයක් ලෙස කටපයාදි සංඛ්‍යා ක්‍රමය හැඳින්විය හැකිය. මෙය කකාරාදි

ව්‍යංඤ්ජනාක්ෂර මුල් කරගනිමින් ගණිනු ලබන සංඛ්‍යා ක්‍රමයකි. සද්දබින්දු ව්‍යාකරණයෙහි මෙම ක්‍රමයෙහි ලක්ෂණ පෙන්වා දී තිබේ.

**'කාදීරිතා නව සඞ්ඛ්‍යා කමෙන ටාදි යාදි ච**
**පාදයො පඤ්චසඞ්ඛ්‍යාතා සුඤ්ඤානාමා සරඤ්ඤනා'**[29]

ක යන්න පටන් ඣ යන්න අවසන් කොට ද, ට යන්න පටන් ධ යන්න අවසන් කොට ද, ය යන්න පටන් ළ යන්න අවසන් කොට ද එක දෙක ආදි වශයෙන් 9 දක්වා ගණන් කළ යුතුය. ප යන්න පටන් ම යන්න අවසන් කොට එක දෙක ආදි වශයෙන් ගණන් කළ යුතුය. ඤ යන්න සහ න යන්නත් ස්වර අටත් බින්දුව වශයෙන් ගත යුතුය.

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 0 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ක | ඛ | ග | ඝ | ඞ | ච | ඡ | ජ | ඣ | ඤ |
| ට | ඨ | ඩ | ඪ | න | ත | ථ | ද | ධ | ණ |
| ප | ඵ | බ | භ | ම | × | × | × | × | × |
| ය | ර | ල | ව | ශ | ෂ | ස | හ | ළ | × |

වචනයකින් හෝ වාක්‍යයකින් දිනයක් දැක්වීමේ දී ක් ග් ම් ආදි ස්වර සමඟ සංයුක්ත නොවූ ව්‍යංඤ්ජන මෙම සංඛ්‍යා ක්‍රමයේ දී ගණනය කරනු නොලැබේ. මෙහි දී පුස්කොළ රචකයින් වර්ෂ හැඳින්වීම සඳහා ද විශේෂ නාම ප්‍රයෝග භාවිත කිරීම ද විශේෂත්වයකි. බුද්ධ වර්ෂ සඳහා **සුගතාබ්දම්** යනුවෙන් ද ශකවර්ෂ සඳහා **සකාබ්දම්** යනුවෙන් ද කලියුග වර්ෂ සඳහා **කල්‍යාබ්දම්** යනුවෙන් ද භාවිත කර තිබේ. එසේ ම ඒ ඒ අක්ෂරයට අදාළ අංක ගණනය කරනු ලබන්නේද අග සිට මුලට ය.

කොළඹ කෞතුකාගාර පුස්තකාලයෙහි ඇති **බුද්දක සික්ඛා** පිටපතෙහි කතුවරයා රචිත කාලය දක්වා ඇත්තේ මෙම කටපයාදි සංඛ්‍යා ක්‍රමය පදනම් කරගෙනය. එනම් **'සුගතාබ්දම් ඤාතිගොත්‍ර වර්ෂෙ ලිඛිතම්'**[30] යනුවෙනි. සුගතාබ්දම් යනු බුද්ධ වර්ෂයි. ඤාතිගොත්‍ර පදයෙහි සංයුක්තාක්ෂර ඉවත් කොට 'ඤතගර' වලට නියමිත අංක යෙදීමෙන් ඤ-0 ද, ත-6 ද, ග-3 ද, ර-2 ද වේ. එනම් 0632 වශයෙනි, ඒවා මුල සිට අගට ගණනය කිරීමෙන් බුද්ධ වර්ෂ 2360 වේ. එනම් ක්‍රිස්තු වර්ෂ (2360-543) 1817 දී ය.

කොළඹ කෞතුකාගාර පුස්තකාලයෙහි **පරමත්ථදීපනී** උදාන අට්ඨකථාවෙහි කාලය දක්වා ඇත්තේ මෙම ක්‍රමයට අනුව බුද්ධ වර්ෂ සඳහන් කිරීමෙනි. එනම් '**සුගතාබ්දම් භාග්‍යවීරම්**'[31] යනුවෙනි. භ-4, ය-1, ව-4, ර-2, 4142 යන්න මුල සිට අගට අංකනය කිරීමෙන් බුද්ධ වර්ෂ 2414 දී මෙය විරචිත බැව් පැහැදිලි වේ. එනම් ක්‍රිස්තු වර්ෂ (2414-543) 1871 දී ය.

මේ අයුරින් ම බුද්ධවර්ෂ සඳහන් කරමින් කාලය දැක්වීම කොළඹ කෞතුකාගාර පුස්තකාලයෙහි ඇති රසවාහිනී පිටපතකින් ද හමුවේ. එනම් '**සුගතාබ්දම් ළාළගෝත්‍රම්**'[32] වශයෙනි. ළ-9, ළ-9, ග-3, ර-2 එනම් 9932 යන්න මුල සිට අගට ගණනය කිරීමෙන් බුද්ධවර්ෂ 2399 එනම් ක්‍රිස්තු වර්ෂ (2399-543) 1856 දී රචිත වූවක් බව පැහැදිලි වේ.

පුස්කොළ රචකයින් සුගතාබ්දම් හෙවත් බුද්ධ වර්ෂ සඳහන් කරමින් කාලය දැක්වූවා සේම **සකාබ්දම්** යන්න යොදා ගනිමින් ශක වර්ෂවලින් ද කාලය දක්වා ඇත. කොළඹ කෞතුකාගාර පුස්තකාලයෙහි ඇති සංයුක්ත නිකාය පුස්කොළ පිටපතක කතුවරයා රචිත කාලය දක්වමින් '**සකාබ්දම් සෙතුසත්‍යම්. වතුරේ ධම්මරක්ඛිත උන්නාන්සේ විසින් ලියවාපු සංයුත් සඟිය**'[33] යනුවෙන් ශක වර්ෂ භාවිත කරයි. ස-7, ත-6, ස-7, ය-1 එනම් 7671 යන්න මුල සිට අගට නැවත සකස් කිරීමෙන් මෙම පිටපත රචනා කර ඇති වර්ෂය වශයෙන් ශක වර්ෂ 1767 බවත් එනම් ක්‍රිස්තු වර්ෂ (1767+78) 1845 බවත් ගණනය කරගත හැකිය.

කොළඹ කෞතුකාගාර පුස්තකාලයෙහි ඇති විසුද්ධිමග්ග පුස්කොළ පිටපතක රචිත කාලය දැක්වීම සඳහා ශක වර්ෂ යොදාගෙන ඇත්තේ මෙසේය. '**ශකාබ්දම් භූමිසත්‍යම්. මුගෙන්ද්‍රාර්කරූපම් භාගම්**'[34] යනුවෙනි. භ-4, ම-5, ස-7, ය-1 එනම් 4571 යන්න මුල සිට අගට ගණනය කිරීමෙන් මෙය ශක වර්ෂ 1754 දී රචිත වූවක් බවත් එනම් ක්‍රිස්තු වර්ෂ (1754+78) 1832 දී බවත් සඳහන් කෙරේ.

බ්‍රිතාන්‍ය පුස්තකාලයේ ඇති වෙස්සන්තර ජාතක ටීකා පුස්කොළ පිටපතක රචිත කාලය දක්වා ඇත්තේ ද මේ ආකාරයෙනි. **සකාබ්දම්**

**භුජතුල්‍ය**[35] වශයෙනි. භ-4, ජ-8, ත-6, ය-1 එනම් 4861 යනු සක වර්ෂ 1684 යි. එය ක්‍රිස්තු වර්ෂ (1684+78) 1762 දී ය.

කොළඹ කෞතුකාගාර පුස්තකාලයෙහි ඇති සිංහල උමංදාව පුස්කොළ පිටපතක රචිත කාලය දැක්වීම සඳහා කතුවරයා කටපයාදි ක්‍රමය මෙන්ම සාමාන්‍ය ක්‍රමය ද භාවිත කරමින් වර්ෂ ක්‍රම තුනක් ඔස්සේ දැක්වීම විශේෂත්වයකි. **'සකාබ්දම් භද්‍රසවූබ්‍යම්. සුගතාබ්දම් මේසගෝත්‍රම්. කල්‍යාබ්දම් ලග්නාර්ධභානු. ශකවර්ෂ එක්වාදහස් හත්සිය විසිපහට පැමිණි වර්ෂයට බුද්ධවර්ෂයෙන් දෙදාසැ තුන්සිය හතලිස් හයක් වූ වර්ෂයට කලියුග වර්ෂයෙන් හාරදාස් නවසිය සතරක් වන - මෙසේ වූ වර්ෂයේ දී ඇසල මස වාස්වසාව දරණ දෙපෝයෙහි දී සඳුදා පසලොස්වක තිතියෙහි මුලෙ නැකතිං ලියා නිමකළ උමංදාවයි.'**[36] මෙම වර්ෂ දැක්වීම පිළිවෙළින් මෙසේ ගණනය කළ හැකිය.

**සකාබ්දම් භද්‍රසවූබ්‍යම්** - භ-4, ර-2, ස-7, ය-1=4271 එනම් ශකවර්ෂ 1724 යි. (ක්‍රි.ව. 1802, එහෙත් මෙහි ජූනි මස ලියා ඇති බැව් දක්වා තිබීමෙන් ශකවර්ෂ 1725 වශයෙන් ද ක්‍රි.ව. 1803 ලෙස ගණිනු ලැබේ) **සුගතාබ්දම් මේසගෝත්‍රම්** - ම-5, ස-4, ග-3, ර-2=5432 එනම් බුද්ධ වර්ෂ 2345 යි. (ක්‍රි.ව. 1802, මෙහි දී ද වෙසක් මාසයට පසුව ඇසළ මස රචිත හෙයින් බුද්ධ වර්ෂ 2346 ලෙස ද ක්‍රි.ව. 1803 යැයි ද ගැනේ) **කල්‍යාබ්දම් ලග්නාර්ධභාන** - ල-3, න-0, ධ-9, භ-4=3094 එනම් කලියුග වර්ෂ 4903 දීය. එහෙත් ඇසල මස පිටපත් කළ හෙයින් 4904 ලෙසත් එය ක්‍රිස්තු වර්ෂයෙන් 1803 ලෙසත් සැලකේ. පිටපත් රචකයා නැවත වර්ෂ සාමාන්‍ය ක්‍රමයෙන් දක්වා තිබීමෙන් මෙහි වර්ෂ නිර්ණය පාඨකයාට නිවැරදිව ලබාගත හැකිය. එනම් ශකවර්ෂ 1725, බුද්ධ වර්ෂ 2346, කලියුග වර්ෂ 4904 දී ඇසළ මස සඳුදා දින පසළොස්වක තිථියෙහි මුවසිරිස හෙවත් මූලෙ නැකතින් ලියා ඇති බව යි.

දකුණ පළාතේ යටගල හෙට්ඨාවල රජමහා විහාරයට අයත් මජ්ඣිමනිකාය පිටපතෙහි කටපයාදි ක්‍රමය භාවිත කරමින් සකවර්ෂ මඟින් රචිත කාලය දක්වා තිබේ. **සකාබ්ධම්සූපසත්‍යම්.**[37] එනම් සකවර්ෂ 1717 (+ 78 = ක්‍රිස්තු වර්ෂ 1795) දීය. මෙය සියවස්

දෙකක් පැරණි පොතක් වුවත් අභ්‍යන්තරයෙහි මාධුරිය සූත්‍රයේ සිට පඤ්චත්තය සූත්‍රය දක්වා සූත්‍ර 17 ක් ගිළිහී තිබීම විශාල පාඩුවකි. ග්‍රන්ථාවසානයෙහි සූත්‍ර පටුන දක්වා තිබේ. කම්බා යුග්මය ඇතුළතින් මෙන් ම පිටතින් ද සිදුකළ අලංකාර සිතුවමින් යුක්ත වේ.

මාතර හිත්තැටිය රජමහා විහාරයට අයත් මජ්ඣිමනිකාය පිටපතෙහි රචිත කාලය දැක්වීමේ දී වර්ෂ කීපයක් ම දක්වා තිබීම විශේෂත්වයකි. පිටපත ලියා අවසානයේ දී කටපයාදි ක්‍රමයට අනුව **'සුගතාද්ධම්මාදබාරම්'**[38] යනුවෙන් බුද්ධවර්ෂ 2385 හෙවත් රාජ්‍යවර්ෂ 1842 පිටපත් කර නිමකරන ලද බව දක්වා තිබේ. එසේ ම පිටපත ආරම්භයේ දීම **'ස්වස්ති සිද්ධම් ක, 1842.11.08'** වශයෙන් ද කම්බා දෙකෙහිම ඇතුළු පැත්තෙහි 1842.10.23 වශයෙන් ද දක්වා තිබේ. ඒ අනුව කම්බා සකස් කොට දෙසතියකට ආසන්න කාලයක් ඉක්ම ගිය පසු පත්ඉරු ලියා අවසන් කර ඇති බැව් පැහැදිලි වේ. ඉතා විසිතුරු කළ කම්බා යුග්මයකින් ග්‍රන්ථය බැඳ ඇත. කම්බා දෙකෙහි ම ඇතුළු පැත්තෙහි නෙළුම් මල් රටා දෙකකට මැදිව කාලය දක්වා තිබේ.

පරමත්ථජෝතිකා නම් ඛුද්දකපාඨ අට්ඨකථා පුස්කොළ පොතේ දී කතුවරයා කටපයාදි ක්‍රමය භාවිත කරමින් බුද්ධ වර්ෂත් චන්ද්‍රමාස ක්‍රමයට අනුව දින වකවානුත් දක්වනුයේ පාලි ගාථා මාධ්‍යයෙනි.

**සටග්සරෙ බුද්ධවස්සෙ - ඵුස්සමාසම්හී ජුණ්හකෙ**
**චොද්දසී ගරුවාරස්මිං - පහිතායතිනා ඉති**

සටග්සරෙ බුද්ධවස්සෙ යනු ස-4, ට-1, ස-4, ර-2=4142 එනම් බුද්ධ වර්ෂ 2412 හෙවත් ක්‍රිස්තු වර්ෂ (2414-543) 1871 දීය. ඵුස්ස මාස නම් දුරුතු හෙවත් ජනවාරි මස, ජුණ්හක නම් පසළොස්වක දිනයි. මෙසේ කටපයාදි ක්‍රමය සිංහල පුස්කොළ පොත්වල කාලය දැක්වීමේ දී විශේෂයෙන් ලේඛකයන් භාවිත කළ ක්‍රමවේදයකි.

## භූතසංඛ්‍යා ක්‍රමයෙන් කාලය දැක්වීම

පුස්කොළ පොත් රචකයින් දින වකවානු දැක්වීම සඳහා භාවිත කළ තවත් සුවිශේෂ ක්‍රමවේදයක් නම් භූතසංඛ්‍යා මඟින් කාලය දැක්වීම යි. එහි දී විවිධ සංකේතාත්මක වස්තුවලින් අංක ගම්‍යමාන

කරමින් ගාථාවකින්, වාක්‍යයකින් හෝ කවියකින් රචිත වර්ෂ සඳහන් කෙරේ. භූත යනු පෘථිවිය, චන්ද්‍රයා, සූර්යයා, සමුද්‍රය යනාදියයි. ඔවුන් කරණ කොටගෙන කරනු ලබන සංඛ්‍යා භූතසංඛ්‍යා නම් වේ. මෙය හැඳින්වීම සඳහා පොදු සංඛ්‍යා ක්‍රමයක් නොමැති අතර ලොව පවතින සංඥා ව්‍යවහාරයෙන් ම දැනගත යුතු බව වෘත්තරත්නාකරයෙන් ද (අබ්ධිභූතරසාදීනාං ඥෙයාඃ සංඥාස්තු ලොකතඃ) වුත්තෝදයෙන් ද (විඤ්ඤෙය්‍යා ලොකතො සඤ්ඤා සමුද්දොසුරසාදිනං)[39] පෙන්වාදෙයි. මෙහි දී ලොව එක වස්තුවක් පමණක් පවතින දේවල්වලින් එනම් චන්ද්‍ර, සූර්ය, පොළොව ආදියෙන් අංක 1 ද, වස්තු දෙකක් පවතින දේවල්වලින් එනම් දෑස, දෙකන, දෑත ආදියෙන් අංක 2 ද, ත්‍රිකාල, ත්‍රිලෝක, ත්‍රිගුණ වැනි වස්තු තුනක් පමණක් පවතින දේවල්වලින් අංක 3 ද චතුර්වේද, සිව්මහා සාගරාදි චතුස්සංඛ්‍යාත වස්තූන්ගෙන් අංක 4 ද, පංච වස්තූන්ගෙන් අංක 5 ද, භූතශරාදි ෂට්සංඛ්‍යාත වස්තූන්ගෙන් අංක 6 ද, අද්‍රි මුනි ආදි සප්ත සංඛ්‍යාත වස්තූන්ගෙන් අංක 7 ද, වසු ගජාදි අෂ්ට සංඛ්‍යාත වස්තූන්ගෙන් අංක 8 ද, ග්‍රහරත්නාදි නව සංඛ්‍යාත වස්තූන්ගෙන් අංක 9 ද විෂ්ණු ආදි දශ සංඛ්‍යාත වස්තූන්ගෙන් අංක 10 ද ආකාශපර්යාය ශබ්දවලින් ශූන්‍ය හෙවත් බින්දුව ද ගණනය කෙරෙයි. මෙහි දී ද ගණනය කිරීම සිදුකරනුයේ ද අග සිට මුලට ය.

භූතසංඛ්‍යා උපයෝගී කරගනිමින් බුද්ධ වර්ෂ මඟින් කාලය දක්වා ඇති අවස්ථාවක් මෙසේය. '**බෞද්ධස්මිං ගගනර්සි වර්ණනයනෙ**'[40] එනම් ගගන හෙවත් අහස-0, රිෂි හෙවත් සප්ත ඉසිවරු-7, වර්ණ හෙවත් ඍග්වේදාදි චාතුර් වර්ණ-4, නයන හෙවත් දෙනෙත්-2=0742 එනම් බුද්ධ වර්ෂ 2470 හෙවත් ක්‍රිස්තු වර්ෂ (2470-543) 1927 වශයෙනි.

කොළඹ කෞතුකාගාර පුස්තකාලයේ ඇති සමන්තපාසාදිකා පුස්කොළ පිටපතක රචිත කාලය වශයෙන් බුද්ධ වර්ෂ දක්වනුයේ ගාථාවකින් භූත සංඛ්‍යා උපයෝගී කරගනිමිනි. '**සුරින්දු වණ්ණ නයනෙ ජිනසාරදම්හි**'[41] මෙහි සුර යනු සූර්යයා-1, ඉන්දු හෙවත් චන්ද්‍රයා-1, වණ්ණ-4, නයන-2=1142 යනු බුද්ධවර්ෂ 2411 හෙවත් ක්‍රිස්තු වර්ෂ (2411-543) 1868 යනුවෙනි.

## නිගමනය

ඉහතින් දැක් වූ විවරණයෙන් පිටපත් රචකයින් විසින් පුස්කොළ පොත්වල රචනා කාලය දැක්වීමේ දී බුද්ධ වර්ෂ, ශක වර්ෂ, කලියුග වර්ෂ සහ චූල ශකවර්ෂ යන ප්‍රධාන වර්ෂ ක්‍රම භාවිත කර ඇති ආකාරය පැහැදිලි වේ. ගද්‍ය පාඨයකින් හෝ පද්‍යයකින් මෙන් ම පාලි, සිංහල, සංස්කෘත, ඉංග්‍රීසි හෝ දෙමළ යන භාෂාවක් උපයෝගී කරගනිමින් සහ විවිධ ශිල්පීය ක්‍රම අනුගමනය කරගනිමින් පුස්කොළ පොත්වල කාලය දක්වා ඇත. එසේම මෙම වර්ෂ හැඳින්වීම සඳහා සුගතාබ්දම්, ශකාබ්දම්, කල්‍යාබ්දම් ආදි විශේෂ නාම ද භාවිත කර තිබේ. වර්ෂ දැක්වීම සඳහා භාවිත මෙම විශේෂ පාරිභාෂික ශබ්ද පුස්කොළ ලේඛකයන්ට පමණක් සීමා වූ ඒවා ලෙස සැලකිය හැකිය. එසේම ගූඪ ලෙස සංඛ්‍යා දක්වන කටපයාදි සංඛ්‍යා ක්‍රමය, භූත සංඛ්‍යා ක්‍රමය ආදිය මගින් වර්ෂ ඉදිරිපත් කිරීම පුස්කොළ පිටපත් රචකයින් සතු වූ විශේෂ කුශලතාවක් වේ.

## ආන්තික සටහන්

1. When did the Buddha live, Ed. Heinz Bechert, 'Research on the Date of the Buddha; South Asian Studies published in Western Language, By Jenus – Uwe Hertmaun' Sri Sataguru Publications, Delhi, India, 1995, pp. 107-124.
2. දක්ඛිණා විභඞ්ග සුත්ත පුස්කොළ පොත, මැදවෙල විහාරය, මහනුවර.
3. දීඝනිකාය පුස්කොළ පොත, අංක 98, ශ්‍රී නරේන්ද්‍රසිංහ රජමහා විහාරය, කුණ්ඩසාලේ, මහනුවර.
4. මජ්ඣිමනිකාය පුස්කොළ පොත, අංක 41336, ජාතික පුස්තකාලය, කොළඹ.
5. මජ්ඣිමනිකාය පුස්කොළ පොත, මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන, වාද්දූව.
6. මජ්ඣිමනිකාය, සුධර්මාරාමය, කපුගම, දෙවිනුවර.
7. මජ්ඣිමනිකාය, සුමංගලාරාමය, විදුරුපොල.
8. Catalogue of Palm Leaf Manuscripts in the Library of the Colombo Museum, Vol. I, Ed. W.A.De Silva, Ceylon Government Press, Colombo, 1930, p. xxii.

9. -Ibid- p. xxii.
10. -Ibid- p. xxii.
11. -Ibid- p. xxiii.
12. Catalogue of the Hugh Nevil Collection of Sinhales Manuscripts in the British Library, Vol. I, Ed. K.D. Somadasa, Pali Text Society, 1987, P. 30.
13. මිලින්ද පඤ්හ පුස්කොළ පොත, අංක 277294, පේරාදෙණිය විශ්වවිද්‍යාලය පුස්තකාලය.
14. Catalogue of the Hugh Nevil Collection of Sinhales Manuscripts in the British Library, Vol. I, p. 287.
15. අංගුත්තර නිකාය පුස්කොළ පොත, ශ්‍රී දළදාමාළිගාව පුස්තකාලය, මහනුවර.
16. දීඝනිකාය පුස්කොළ පොත, අංක 27, රිදීවිහාරය, කුරුණෑගල.
17. මජ්ඣිමනිකාය, අංක 124, බුදුමුත්තාව රජමහා විහාරය, නිකවැරටිය.
18. Pāli Sīlakkhandhavagga Dīghanikāya, Lanna, Wat Sung Men Phrae Thailand.
19. Journal of the Pali Text Society Vol. XIV, Ed. K.R.Norman, 'the colophons of thirty Pali Manuscripts from Northern Thailand, by H.Hindius', p. 59.
20. -Ibid- p. 63.
21. Dīghanikāya (Sīlakkhandhavagga), Burmese Scripts, State Pariyatti Sasana University, Mandalay, Myanmar.
22. Dīghanikāya (Sīlakkhandhavagga), No. 197, Burmese Scripts, Bakara Temple, Amarapura, Myanmar.
23. සිංහල සඟි පුස්කොළ පොත් එක පොතක් වශයෙන් සම්පූර්ණයෙන් ලියවී ඇතත් බුරුම, ලන්නා පිටපත් කොටස් වශයෙන් වෙන වෙන ම රචනා වී ඇත. නිදර්ශනයක් ලෙස දීඝනිකාය සංග්‍රහ වී ඇත්තේ සීලක්ඛන්ධ, මහාවග්ග සහ පාටිකවග්ග යනුවෙන් පුස්කොල පොත් තුනක් වශයෙනි. එබැවින් එකම පොත වර්ෂ කිහිපයක් තුළ කොටස් වශයෙන් සම්පූර්ණ වී ඇති ආකාරයක් ද දැකිය හැකිය.
24. Dīghanikāya (Sīlakkhandhavagga), Burmese Scripts, No. 11568, Universities' Central Library, Yangon,Myanmar.
25. Dīghanikāya (Sīlakkhandhavagga), Burmese Scripts, No. D.5-1759, The Library of Colombo Museum.
26. Catalogue of the Hugh Nevil Collection of Sinhales

Manuscripts in the British Library, Vol. I, p. 335.
27. Catalogue of the Hugh Nevil Collection of Sinhales Manuscripts in the British Library, Vol. I, p. 35.
28. මජ්ඣිමනිකාය, ශ්‍රී විජයසුන්දරාරාමය, කඩිහාර, බමුණාකොටුව.
29. Journal of the Pali Text Society XI, Ed. K.R.Norman, The Saddabindu; and its 'new' commentary, By Friedgard Lottermoser', 1987, v.2, p. 81.
30. Catalogue of Palm Leaf Manuscripts in the Library of the Colombo Museum, Vol. I, p. 12.
31. -ibid- p. 30.
32. -ibid- p. 252.
33. -ibid- p. 20.
34. -ibid- 247.
35. Catalogue of the Hugh Nevil Collection of Sinhales Manuscripts in the British Library, Vol. I, p. 36.
36. Catalogue of Palm Leaf Manuscripts in the Library of the Colombo Museum, Vol. I, p. 265.
37. මජ්ඣිමනිකාය, අංක 17, හෙට්ඨාවල රජමහා විහාරය, යටගල.
38. මජ්ඣිමනිකාය, අංක 218, හිත්තැටිය රජමහා විහාරය, මාතර.
39. වුත්තෝදය, සංස්. ලබුගම ලංකානන්ද හිමි, ද්‍රාවිත පෙරේරා මුද්‍රණය, 1946, 1 පිටුව, 10 ගාථාව.
40. Catalogue of Palm Leaf Manuscripts in the Library of the Colombo Museum, Vol. I, p. xxiv.
41. -ibid- p. 4.